# ශ්‍රී ලංකාවේ සිංහල මාධ්‍ය ගුරු විද්‍යාලයන්හි ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කියවීමේ පුරුද්ද පිළිබඳ අධ්‍යයනයක්

වයි. හැරිසන් ද සිල්වා

1978 ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යෝදය මණ්ඩපයේ (ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලය) ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධය

122724

ශී 5663

## සාරාංශය

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සිංහල මාධ්‍ය ගුරු විද්‍යාලයන්හි ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කියවීමේ පුරුද්ද හා රුචිය පිළිබඳව තොරතුරු ගවේෂණය කිරීමයි. ශිෂ්‍යයන්ගේ කියවීමේ පුරුද්ද සම්බන්ධව කරුණුඅනාවරණය කරගත හැකි සෑම අංශයක් ගැනම විමසා බැලීම සිදුකරන ලද බව මෙහිලා සඳහන් කළ යුතුවේ.

අධ්‍යයනය සිදුකරන ලද ආකාරය පිළිබඳව වූ ක්‍රම විද්‍යාවත් ඒ හා සම්බන්ධ හැඳින්වීමකුත් සංක්ෂේපයෙන් පළමුවන පරිච්ඡේදයේ දී සාකච්ඡා කෙරෙයි. මෙයට ක්‍රම විද්‍යාවේ විවිධ අංශත්, ඒ ඒ ගුරු විද්‍යාලයන් සමීක්ෂණයට ඇතුලත් කරගැනීමට හේතුත් ඇතුලත්ය.

දෙවන පරිච්ඡේදයෙන් ගුරු විද්‍යාලවල පිහිටීම හා ඉතිහාසය පිළිබඳ කරුණු කෙටියෙන් දැක්වෙයි. ඒ ඒ ගුරු විද්‍යාල පිහිටුවන ලද වර්ෂත්, දැනට උගන්වන පාඨමාලා හා එහි අඩංගු විෂයයන්, ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ විස්තරද ඇතුලත්ය.

ගුරු විද්‍යාලවල පුහුණුව සඳහා පැමිණීමට පෙර පැවති කියවීමේ පුරුද්ද පිළිබඳ කරුණු සොයා බැලීම තෙවන පරිච්ඡේදයේ අරමුණ වෙයි.

පුහුණුව සඳහා ගුරු විද්‍යාලවලට ඇතුලත්වූ පසු ශිෂ්‍යයන් තුල දක්නට ලැබුණේ කුමන ආකාරයක කියවීමේ පුරුද්දක්ද යන්න පිළිබඳ කරුණු සිව්වන පරිච්ඡේදයෙන් හෙළිවේ. කියවීමේ පුරුද්ද පිළිබඳ කරුණු කුමන මට්ටමක පවතින්නේද, රුචිය කෙබඳු එකක් ද යන කරුණු මෙයට ඇතුලත්ය.

කියවීමේ පුරුදු ගැන සෙවීමේදී පුස්තකාලය ඒ හා පවත්නා සම්බන්ධතාව පස්වන පරිච්ඡේදයෙන් විමසෙයි. පුස්තකාලයෙන් පොත් කියවීමට ගන්නා ආකාරය, පුස්තකාලය සමඟ පවත්වන සම්බන්ධතාව හා ඉන් දක්නට ලැබෙන නැඹුරුවීම් කෙරෙහි මෙහිදී වඩාත් අවධානය යොමු කෙරේ.

සවන පරිච්ඡේදයෙන් වඩාත් පුළුල්ව ගුරු විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කියවීමේ පුරුද්ද හා රුචිකත්වය පිළිබඳ කරුණු විග්‍රහ කෙරිනි. මෙහි නියමිත පාඨමාලාවට අදාළ හා ඉන් පරිබාහිර පොත් පත් හා සඟරා වැනි අංශ ගැන විචාරාත්මක විශ්ලේෂණයක් කෙරෙයි.

# ප ටු න


| | පිටු |
|---|---|
| සාරාංශය | 1 |
| උපකාරානුස්මෘති | 2 |
| සංකේත | 3 |
| I වන පරිච්ඡේදය: හැඳින්වීම හා ක්‍රම විද්‍යාව | 4 - 12 |
| II වන පරිච්ඡේදය: ගුරු විද්‍යාල හා එහි ඉතිහාසය | 13 - 23 |
| III වන පරිච්ඡේදය: පූර්ව ගුරු විද්‍යාල අවධියේ ශිෂ්‍යයන්ගේ කියවීමේ පුරුද්ද | 24 - 34 |
| IV වන පරිච්ඡේදය: ගුරු විද්‍යාල අවධියේ ශිෂ්‍යයන්ගේ කියවීමේ පුරුද්ද | 35 - 46 |
| V වන පරිච්ඡේදය: ගුරු විද්‍යාල පුස්තකාල සහ කියවීම | 47 - 66 |
| VI වන පරිච්ඡේදය: ගුරු විද්‍යාලීය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කියවීමේ පුරුද්ද | 67 - 89 |
| නිගමනය | 90 - 97 |
| උප ග්‍රන්ථය: වගු | 98 - 117 |
| : ප්‍රශ්නාවලිය 1 | 118 - 121 |
| : ප්‍රශ්නාවලිය 2 | 122 |
| : ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 123 - 125 |